කොවිඩ් 19 - සති පාසල - සබරගමු පළාත

9 ශ්‍රේණිය ඉතිහාසය (7 වන සතිය)

ඒකකය - 04 <u>ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය</u>

- ක්‍රියාකාරකම් අංක 02 - ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත්විජිතයක් වීම 1

පැවරුම් අංක 02

හැදින්වීම:- ඉංග්‍රීසින් හා ප්‍රංශ ජාතිකයන් යුරෝපය තුළ ආර්ථික හා දේශපාලනික බලය උදෙසා මේ වනවිට බල අරගලයක නිරතවෙමින් සිටි අතර ඉංග්‍රීසින්ගේ පැමිණීමෙන් පසු ඉන්දියාවට ප්‍රංශ ජාතිකයන් පැමිණීම සමඟ එම ගැටුම් මේ දෙපාර්ශවය අතර ඉන්දියාව තුළද ඇතිවිය. මෙය ඉංග්‍රීසින්ට විශාල අභියෝගයන් විය. මෙහිදී ඉතා උපක්‍රමශීලී වූ ඉංග්‍රීසින් සිය අභියෝගයන් ජයගැනීමට පියවර ගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත්විය

- ගුණාත්මය යෙදවුම් :- 9 ශ්‍රේණියේ ඉතිහාසය පෙළ පොත/ඉතිහාසය සටහන් පොත්

- ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්

පියවර 01:- ඉතිහාසය පෙළ පොතේ පිටු අංක 72 සිට 77 දක්වා හොඳින් කියවාගන්න.

පියවර 02:- @ පසුගිය සතියේ ප්‍රශ්නාවලිය අවසන් වූ තැනින් ඉහතින් දී ඇති හැදින්වීම සටහන් කර ගන්න.
@ පසුව පහතින් සපයා ඇති ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සපයන්න.
(පිළිතුරු සැපයීමට පෙර ප්‍රශ්නය සටහන් කිරීම අනිවාර්ය වේ.)

ප්‍රශ්නාවලිය.

01) ක්‍රි.ව.1701 දී මියගිය මූගල් අධිරාජ්‍යා කවුරුන්ද?
02) ක්‍රි.ව.1761 දී පොන්ඩිචේරිය බලකොටුවේ බලය තහවුරු කර ගත්තේ කුමන යුරෝපීය පිරිසක් විසින්ද?
03) බ්‍රිතාන්‍යන් ඉන්දියාවේ බලය තහවුරු කිරීමට යොදාගත් ක්‍රමවේද 2 ක් දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න.
04) සිපොයි කැරැල්ල යනු කුමක්ද?
05) සිපොයි කැරැල්ලට බලපෑ හේතු මොනවාද?
06) සිපොයි කැරැල්ලට බලපෑ ආසන්න හේතුව කුමක්ද?
07) සිපොයි කැරැල්ල අසාර්ථක වීමට හේතු මොනවාද?
08) සිපොයි කැරැල්ලේ ප්‍රතිඵල මොනවාද?
09) සිපොයි කැරැල්ල ඇතිවූ අතරතුර ඉංග්‍රීසි වෙඩි පහරින් මියගිය සිපොයි භටයා කවුරුන්ද?
10) සිපොයි කැරැල්ල ඇතිවූ වර්ෂය ලියා දක්වන්න?

පසුවැඩ:-
ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරයේ කැපීපෙනෙන අවස්ථවක් ලෙස සිපොයි කැරැල්ල දැක්විය හැකිවේ. මෙය ඉන්දියානුවන් තුළ නිදහස පිළිබඳ හැඟීම් වර්ධනයට හේතුවිය. " ඉන්දියානු නිදහස් සටනට මග කියූ 1857 සිපොයි කැරැල්ල " යන තේමාව යටතේ පුවත්පතට ලිපියක් ලියන්න.

සැකසුම:- උදාර අරවින්ද.